කලාප අධ්‍යාපන කාර්යාලය, මතුගම. කලාප අධ්‍යාපන කාර්යාලය, මතුගම. කලාප අධ්‍යාපන කාර්යාලය, මතුගම. කලාප අධ්‍යාපන කාර්යාලය, මතුගම.

# කලාප අධ්‍යාපන කාර්යාලය, මතුගම.

## දෙවන වාර පරීක්ෂණය 2019, මාර්තු

**13 ශ්‍රේණිය**

| සිංහල II | 71 | S | II | පැය තුනයි |
|---|---|---|---|---|

සැලකිය යුතුය :-
- ♦ I කොටසේ I ප්‍රශ්නය ද, II කොටසේ 2 , 3 ප්‍රශ්න ද ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- ♦ I ප්‍රශ්නයේ ඇති සියලුම අනු කොටස්වලට මෙම ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සපයන්න.
- ♦ I කොටස, II කොටසේ පිළිතුරුපත් සමග අමුණා භාර දෙන්න.

### I කොටස

01. එක් එක් ප්‍රශ්නයට වඩාත්ම ගැළපෙන පිළිතුර තෝරා එයට හිමි අංකය වරහන් තුළ ලියන්න.

1. 1 මූර්ධජ අක්ෂර පමණක් යෙදුණු වරණය තෝරන්න.
1. ක , ඛ , ග , ඝ , ඞ , හ
2. ච , ඡ , ජ , ඣ , ඤ . ශ
3. ට , ඨ , ඩ , ඪ , ණ , ෂ
4. ත , ථ , ද , ධ , න , ල
5. ඟ , ඦ , ඬ , ඳ , ඹ , ෂ

(.........)

1. 2 නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පද පේළිය තෝරන්න.
1. සෞන්දර්ය , මහලු , මර්ධනය , සමස්ථ , විශාරධ
2. ගැටලු , ගෘහණිය , පුස්ථකාලය , වීරෝධාර , අග්‍රබෝධි
3. විශ්වාසය , කන්කලු , භස්මාවශේෂ , සම්ප්‍රදාය , ප්‍රශ්නය
4. ව්‍යාපෘතිය, පුස්තකාලය , මර්දනය , ප්‍රකාශනය , ගෞරවාර්ථය
5. සංශයාර්ථය , ආමන්ත්‍රනය , අපරාධය , අනාභිමුඛ , කනිෂ්ඨ

(.........)

1. 3 ආකාරාදි පිළිවෙල අනුව නිවැරදිව ලියා ඇති පද පේළිය තෝරන්න.
1. අමාවතුර , වදන්කවිපොත , ලෝවැඩ සඟරාව , බුත්සරණ , ජාතකපොත
2. කව්සිළුමිණ , පංචිකාප්‍රදීපය , දළදාසිරිත , බුත්සරණ , ලෝකෝපකාරය
3. අමාවතුර , පූජාවලිය , සද්ධර්මාලංකාරය , සුභාෂිතය , ගණදෙවිහැල්ල
4. කව්සිළුමිණ , පූජාවලිය , බුත්සරණ , දහම්ගැටය , වියොවගරත්නමාලය
5. අමාවතුර , උම්මග්ග ජාතකය , එළුසඳැස් ලකුණ , දළදා සිරිත , පූජාවලිය

(.........)

1. 4 පහත සඳහන් ප්‍රකාශ අතුරින් නිරවද්‍ය ප්‍රකාශය තෝරන්න.
1. ''ඌ'' යන්නට යෙදී ඇති පිල්ලම ගයනුකිත්තය.
2. රේඵය යොදන්නේ වචනයක ව්‍යංජනයකට පෙර ඇති ''ර්'' වෙනුවටය.
3. ''ය'' යොදන කල ඊට පෙර යෙදෙන හල් අකුරේ වෙනසක් සිදු නොවේ.
4. දික්වක් පාපිල්ල රකාරාංශයට යෙදිය නොහැක.
5. ගයනුකිත්ත අන් අකුරක් හා යෙදෙන විට කොම්බුව අත්‍යවශ්‍ය නොවේ.

(.........)

1. 5 එකිනෙක අනුරූප වන සේ වචන යුගල යෙදී ඇති වරණය සොයන්න.
1. රජ මහා වෙහෙර , මුහුදු බාදනය , ත්‍රිපිටක දහම , පිරිත් දේශනය , ඝන අඳුර
2. කතු වැකි , ජල ධහරා , සත්ව උද්‍යානය , අබිසෙස් මංගල්‍යය , මුහුදු කෑම
3. කලණ මිතුරා , ජීව බස , ඇමති මණ්ඩලය , ස්වභාදහම , නා හිමි
4. නා හිමි , ඇමති මණ්ඩලය , සූර්ය උදාව , පිරිත් දෙසුම , පංච සීලය
5. චන්ද්‍ර මණ්ඩලය , මුහුදු කෑම , කල්‍යාණ මිත්‍රයා , අබිසෙස් මඟුල , කර්තෘ වාක්‍ය

(.........)

1. 6 තත්සම වචන පමණක් යෙදී ඇති වරණය තෝරන්න.
1. අන්ධ , බිම , කල්‍යාණි , චන්දන , මාර්ගය , සඳුන්
2. පසිඳු , දඹ , ආචාර , භූමි , ප්‍රසිද්ධ
3. වාද්‍ය , උයන , ලතා මණ්ඩපය , උතුරු දෙස , දළදා මැදුර
4. භයංකාර , පෞරුෂය , සහෘදයා , භෘංග , සමස්ත
5. විෂමාචාර , සිරිත් , පරිෂ්කාර , ප්‍රවිෂ්ට , ව්‍රතය

(.........)

1. 7 තද්භව වචන පමණක් අන්තර්ගත වන වරණය තෝරන්න.

1. මාතෘ , යක්ෂ , පූර්ණ , ඖෂධ , කර්ම
2. වර්ග , අට්ඨි , රුක්ඛ , නාටක , කම්ම
3. මව් , යක් , පුන් , ඔසු , කරුම
4. වෘක්ෂ , නළු , සත් , දඩ , ශාස්ත්‍ර
5. රුක්ෂ , නාටක , පත්‍ර , ජම්බු , ශීර්ෂ (.........)

1. 8 කරණ , අවදි , සම්බන්ද , සම්ප්‍රදාන යන විභක්තිවලට අයත් සමාස පද පිළිවෙලින් දැක්වෙන්නේ,

1. දෑවකම්, මුහුදු හුළං , බුරුවැඩ , ගොවිපෝර
2. සොරබිය , දෙව්දත් , රන්කම් , ගුරු අත් පොත්
3. බලුපොර , වනමල් , අහස්දිය , මුංකැවුම්
4. කිරිබත් , දෙව්දත් , ගත්කරු , බුදුබණ
5. මුහුදු මාළු , ගැනු ගති , සිසු සරඹ , වැඩකරු (.........)

1. 9 කෘදන්තයක් නොවන පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

1. බැඳුණු , වසින , නසනු , බලනු , රවනු
2. ගයන , බලන , නටන , නවන , සිතන
3. ගැයීම් , වැයීම් , සිතීම් , රිදීම් , ඇදීම්
4. දෙසීම් , නසන , ඇවිදිලි , පිදවිලි , තැවීම්
5. නැවුම් , නැටුම් , රැවුම් , කැවුම් , ගැරහුම්

(.........)

1. 10 පහත සඳහන් උද්ධෘතවල ඉරි ඇඳ පද අයත් ක්‍රියා වර්ගය පිළිවෙලින් දක්වා ඇති වරණය තෝරන්න.

අ. ''<u>ඉඳ ඉඳ</u> එක වෙහෙර''
ආ. ''ගුරු බෙවුලේ <u>යව</u> අවුලේ නොව් කිස''
ඇ. ''පම්ටු දුදනෙකු <u>කළෙම්</u> අතවැසි''
ඈ. ''<u>නටත්</u> අයෙක් සුරා මතින්''

1. පූර්ව ක්‍රියා , මිශ්‍ර ක්‍රියා , විධි ක්‍රියා  අසම්භාව්‍ය ක්‍රියා,
2. පූර්ව ක්‍රියා , විධි ක්‍රියා , ශුද්ධ ක්‍රියා , පූර්ව ක්‍රියා
3. මිශ්‍ර ක්‍රියා , අසම්භාව්‍ය ක්‍රියා , විධි ක්‍රියා , ශුද්ධ ක්‍රියා
4. අසම්භාව්‍ය ක්‍රියා , මිශ්‍ර ක්‍රියා , විධි ක්‍රියා , කර්ම ක්‍රියා
5. විධි ක්‍රියා , පූර්ව ක්‍රියා , මිශ්‍ර ක්‍රියා , අසම්භාව්‍ය ක්‍රියා

(.........)

1. 11 තද්ධිතයක් නොවන පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

1. අධ්‍යතන , උපාධිධාරියා , ගාම්භීරත්ව , නාගරික , සිරිමත්
2. ගඟබඩ , නූතන , පාපතර , සිටාණෝ , රුසියානුවෝ
3. විශාලතම , මුවවිට , සාරවිට , තොපුලත් , රුමත්
4. රන්මුවා , උදාරතම , ගෝලීය , ක්‍රීඩාශීලි , නීතිගරුක
5. ආධාරලාභී , පිරිසිදු කම , කම්කරු, නිශාචර , මෙහෙකරු

(.........)

1. 12 උපසර්ගයක් යෙදී නොමැති පදයක් සහිත වරණය තෝරන්න.

1. පබල , අපමණ , අවනීතිය , විවාද , සුදන
2. සංයුක්ත, අතිවිශාල , සුපිරිසිදු , අකුසල් , ප්‍රතිඵල
3. සලකුණ , විමල් , නිමල් , කමල් , අභිමාන
4. සුවිමල් , දුෂ්කර , අභිරහස , අපවාද , අවමාන
5. පරසිත් , අනුකූල , ඉපැරණි , අනුනායක , සුමිහිරි

(.........)

1. 13 නිපාතයක් නොවන පදයක් අන්තර්ගත වරණය වන්නේ,

1. විතර , පවා , පාසා , වස් , තෙක්
2. පරිදි , අනුව , සේ , දෝ , පාසා
3. ඉතින් , නිබඳ , ඇයියා , හෙට , සහ
4. කුමක්, හෙයින් , කෝ , අපෝ , නිසා
5. පිණිස , නිසා , උදෙසා , දහමක් , අරබයා (.........)

1. 14 ''<u>අමාත්‍යාංශයේ</u> උපදෙස් මත <u>වෙසක්පොහොය</u> නිමිත්තෙන් <u>දර්ශනීය</u> වෙසක් කලාපයක් ඉදි කරන ලදී.'' යන වාක්‍යයෙහි වචන යෙදී ඇති පිළිවෙල අනුව ඉරි ඇඳි පද අයත් ව්‍යාකරණ අංග වන්නේ කුමන වරණය ද?

1. තද්ධිත , සමාස , සන්ධි
2. සමාස , තද්ධිත , සන්ධි
3. තද්ධිත , සන්ධි , තද්ධිත
4. සමාස , සන්ධි , තද්ධිත
5. සන්ධි , සමාස , තද්ධිත (.........)

1.15 සමාන ව්‍යාකරණ ලක්ෂණ නිරූපණය කරන ක්‍රියාරූප සහිත වරණය තෝරන්න.

1. බලමින් , කරමින් , සිත සිත , අඬ අඬා , කකා
2. දමා , සැදුණි , පිරුණු , ගොස් , දැක
3. බැලූ , දැකුම් , කැවේය , පැමිණ , අසා
4. වැටුණොත් , සිතද්දී , දකිමි , ගිලිහුණි , දකින්නා
5. සකස් කිරීම , දැමුවහොත් , කරද්දී , කරමු , ලිය වේ. (.........)

1.16 සමාසයක් නොවන පදයක් අන්තර්ගත වරණට වන්නේ,

1. සිප්සයුර , මරණපහුර , හදවිල , මුවකමල , ජීවනකුසුම
2. වනමල් , පොල්කොළ , නරසි , දළදා , මව්පිය
3. මුහුදු වැලි , එළුමස් , සියපත් , පරවැඩ , සුරලොව
4. කිරිබත් , මැටිබඳුන් , බුදුදහම , අටසිල් , රජපිරිස
5. සොරබිය , නිල්දිය , රතු ගවුම් , සුදු කෙස් , නවරත්න. (.........)

1.17 එකම වර්ගයට අයත් සන්ධි පද ඇතුළත වරණය තෝරන්න.

1. අත්තම් , දිනිසුරු , මුලසුන , චූලෝදර , කම්මල
2. වත්තල , වල්ලම්බලම , ගොක්කත්ත , පොල්ලත්ත , දඩයම්
3. නෙළුම් මල් , ළිග්ගල , සිතුවම් , බලැති , පියුමුපුල
4. වත්තල , ඇත්තල , ගෙත්තම් , කම්මල , වන්නම්
5. කොල්ලා , වැල්ලම්පිටිය , වංමුතු , ළිංපඩි , මුංපියළි (.........)

1.18 ව්‍යාකරණානුකූල ව නොගැළපෙන පදයක් සහිත වරණය තෝරන්න.

1. ප්‍රභාවත් , ගුණවත් , නැණවත් , ආලෝකමත් , සත් ගුණවත්
2. කරවයි , අසවයි , වට්ටවයි , දම්මවයි , නග්ගවයි
3. ප්‍රීතිමත් , විධිමත් , සිරිමත් , කෙත්වත් , වතාවත්
4. නිකෙලෙස් , කුකුරිස් , ඉසුරු , පිළිකුල , අතිමහත්
5. වසන කල , බලනවිට , කියවන කොට , දෙසන සේක් , ලියන කල (.........)

1.19 ව්‍යාකරණානුකූලව නිවැරදි වැකිය තෝරන්න.

1. තුවාල ලද්දෝ කෙඳිරි ගා හඬති.
2. ගොවියෝ රජරට කුඹුරු අස්වද්දාලී ය.
3. පූජාවලියේ කතුවරයා වූයේ මයුරපාද හිමියෝ
4. මානව හිතවාදීන් දැ හිතකාමී වෙති.
5. සාහිත්‍ය කරුවෝ කලාව අභිමානවත් ඉසව්වකට කැඳවාගෙන යයි. (.........)

1.20 ලේඛන ව්‍යවහාරයට වඩාත් සුදුසු වාක්‍ය සහිත වරණය වන්නේ,

1. සේවකයන් වැඩමුරය ඉවර කර ගැනීමට උත්සහ දරයි.
2. මොකක්ද ඔය වෙලා තියෙන්නෙ?
3. එයයි මායි පාරෙ එනකොට දැක්කෙ.
4. අපි පොත් ටිකක් අරන් පුස්තකාලෙට යමු.
5. අපි ගිහිල්ලා එන්නම්. (.........)

(ලකුණු 20)

## II කොටස

02. අ. පහත සඳහන් පාඨය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ඉතිහාසඥයන් උඩරට රාජධානිය කෙරෙහි දක්වූ අවධානය ප්‍රමාණවත් නොවන බව ප්‍රකාශ කිරීම නිර්දය විවේචනයක් නොවනු ඇත. දහසයවන ශත වර්ෂයෙන් පසු ශ්‍රී ලංකා ඓතිහාසික අධ්‍යයන මැතක් වන තුරු ම පවත්වා ඇත්තේ යටත් විජිත රාමුව ඇතුළත, දිවයිනෙහි බටහිර මුහුදුබඩ තීරුවෙහි පාලන බලය දැරූවන් මුහුණ පෑ ගැටලු පිළිබඳව ය. ඒ සෑම අධ්‍යයනයක ම මහනුවර පිළිබඳ වටිනා යමක්, සිත් ගන්නා යමක් ඇතුළත් වන බව සැබෑ ය. එහෙත් මෙහි දී සැලකිල්ලට ගත යුතුව ඇත්තේ මහනුවර යනු ඔවුන්ගේ අවධානයෙහි සීමාවෙහි පිහිටියක් බව ය. ඒවායේ මූලික අවධානය යොමු ව ඇත්තේ කෝට්ටේ රාජධානිය කෙරේ හෝ කෝට්ටේ රාජ වංශය අවසානයෙන් පසු එම බිම් පෙදෙස් පාලනය කළ පෘතුගීසි හා ඕලන්ද ජාතිකයන් කෙරෙහි ය. කෙටියෙන් කිවහොත් වැඩි වශයෙන් ලිය වී ඇත්තේ යටත් විජිත ඉතිහාසය යි.

සිංහල රාජධානිය ස්වකීය ස්වාධීනත්වය ආරක්ෂා කර ගැනීමට වෙර දරූ ආකාරය කෙරෙහි ඔවුන්ගේ සැලකිල්ල යොමු වූයේ මඳ වශයෙනි. එසේ වුව ද පසුගිය දශක දෙක ඇතුළත එස්. අර්සරත්නම් කේ. ඩබ්ලිව් ගුණවර්ධන සහ ටිකිරි අබේසිංහ යන විද්වතුන්ගේ ලිපි ලේඛනවල නව ප්‍රවණතාවක් දක්නට ලැබේ. යටත් විජිත ඉතිහාසය ලියන අතර ම ඔවුහු දේශීය ආයතන කෙරෙහි ද දැඩි උනන්දුවක් දක්වූහ්

උඩරට රාජධානිය පිළිබඳව වූ ඓතිහාසික ලිපි ලේඛන හිඟ වීමට හේතු දැක්විය හැකිය. ලෞකික ඉතිහාසය ලේඛනගත කිරීමට දියුණු දේශීය සම්ප්‍රදායක් ශ්‍රී ලංකාවේ නොතිබීම එක් හේතුවක් වෙයි. උඩරට රාජධානියේ ලේඛනාගාරයට අයත් එක ද කඩදාසියක් හෝ තල්පත් ඉරුවක් හෝ සුරැකි ව ශේෂ ව නොමැති ය. වැදගත් ලිපි ලේඛන රාශියක් ම බොහෝ විට පන්සල් සතු පුස්තකාලවල හෝ පුද්ගලයන් සතුව හෝ විසිර පවතී. මේ හෙයින් උඩරට ඉතිහාසය හදාරන විද්‍යාර්ථියාට, දිවයින පුරා විසිර ඇති දිරාපත් ලිය කියවිලි අතර තම සාධක සෙවීමට සිදුවෙයි. එසේ නැතහොත් සම්පූර්ණයෙන් ම විදේශීය මූලාශ්‍ර ආශ්‍රයෙන් තම අධ්‍යයනය කළ යුතු වෙයි. මේ දෙවැනි මඟ අනුගමනය කළහොත් උඩරට රාජධානියේ ඉතිහාසය, දේශපාලනය හා වාණිජමය වශයෙන් එයට සතුරු වූ ජාතියකගේ වාර්තා පදනම් ගෙන ලිවීමට සිදු වෙයි.

i. උඩරට රාජධානිය පිළිබඳ ව ගැඹුරු ඓතිහාසික අධ්‍යයන හිඟ වීමට හේතු වශයෙන් මේ ලේඛකයා දක්වන කරුණු දෙකක් සඳහන් කරන්න.

ii. මේ ලේඛකයා ශ්‍රී ලංකාවේ ඉතිහාසඥයන් ප්‍රධාන වශයෙන් කී වර්ගයකට වෙන් කොට දක්වයි ද? ඔවුන් අතර පවත්නා මූලික වෙනස්කම් කවරේ ද?

iii. ටිකිරි අබේසිංහ වැනි විද්වතුන්ගේ අධ්‍යයන, ඉතිහාසඥයන්ට වැදගත් වන්නේ කවර හෙයින් ද?

iv. ඉතිහාසය ලිවීම සඳහා යොදා ගත් ප්‍රධාන මූලාශ්‍ර දෙකක් ගැන මේ ලේඛකයා සඳහන් කරයි. ඒ මොනවාද?

v. ලේඛකයා සඳහන් කරන පරිදි දෙවන මූලාශ්‍රය අනුගමනය කිරීමේ දී කුමක් සිදු වේවි ද?

vi. ''නිර්දය විවේචනයක'' හා ''ලෞකික ඉතිහාසය'' යන යෙදුම් පැහැදිලි කරන්න.

(ලකුණු 12)

ආ. පහත දැක්වෙන උද්ධෘත කියවා, එහි වචන සංඛ්‍යාව තුනෙන් එකක් පමණ වන සේ සාරාංශ කොට ලියා, සාරාංශය අග වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.

ජාතක කතා ගී කාව්‍යයන්හි ආකෘතිය වශයෙන් තෝරා ගන්නේ ගී කවීන් තත්කාලීන පොදුජන රුචියට අනුකූලතාවය දැක්වීමත් වශයෙනියි කිය හැකිය. එහෙත් ඔවුන් ඒ කථා කාව්‍යයට නැගීමේ දී අනුගමනය කළ මාර්ගය නම්, පොදු ජන රුචිය දිනා ගැනීමෙහි නොසමත් වූ බැව් ඉඳුරාම පැවසිය හැකිය. එමෙන්ම එමඟින් සිංහල පද්‍ය සාහිත්‍යයේ අභිවෘද්ධියට ද එතරම් පිටුබලයක් වී යැයි සිතිම ද දුෂ්කරය. මුලින් ම ගියට නැගූ ජාතක දෙකින් පාඨකයා අමුතු රසයක් ලැබී යැයිද කීම අපහසු ය. සිංහල සමාජයෙහි සංස්කෘතික වශයෙන් සිදු වූ ගැටීම්වල ප්‍රතිඵලයක් වශයෙන්, ගී කවීන් තත්කාලීන සමාජයෙන් ඈත් වූ පරිසරයක් වර්ණනා කිරීමට පෙළඹීම මීට ප්‍රධාන හේතු වශයෙන් දැක්විය හැකිය. මේ නිසාම මේ කාව්‍යයන්හි ප්‍රධාන කථා රසයට තුඩු නොදෙන වන වර්ණනා, මාර්ග වර්ණනා, ඍතු වර්ණනා, පර්වත වර්ණනා, ජල ක්‍රීඩා වර්ණනා ආදිය දිස් වෙයි. මේ හැම වැනුමකම හරය භාරතීය කවීන් සංස්කෘත මහාකාව්‍ය සම්ප්‍රදායයෙහිලා අනුගමනය කළ මාර්ගය අනුව උකහාගත් බැව් ඒවා පිරික්සීමෙන් දත හැකිය. එසේ නොවන්නට මොවුන්ගේ වර්ණනා විෂයය කෙරෙහි අප රටේ ස්වභාව සෞන්දර්යයට අයත් වන, නදී , පර්වත අයත් වන්නට ඉඩ තිබිණ. ජාතක කතාවක් ගුරු කොට ගෙන කතා කාව්‍යයක් නිර්මාණය කිරීමට වඩා මේ කවීන් බලාපොරොත්තු වූයේ සංස්කෘත අලංකාර විභාගයට නිදසුන් සැපයීමට යැයි

සමහර විචාරකයින් පවසන්නේ ද මේ ලක්ෂණ මේ ගී කාව්‍ය දෙකෙහි විද්‍යාමා නිසා යැයි කීමට අපට සිදු වෙයි. මොවුන්ගේ සමහර අවස්ථා නිරූපණ අනුව මොවුන් ද ප්‍රතිභා පූර්ණ කවීන් යැයි පැවසිය හැකි වුවත් සම්ප්‍රදාය නමැති මියර බිඳගෙන ඉදිරියට යෑමට මේ කවීන් අපොහොසත් වූ නිසා මොවුන් සතුවූ ස්වාධීනත්වයට මග අවුරා ගත් බව පෙනේ. සිංහලයෙහි ප්‍රශංසන ගී කවක් හැටියට සලකන කව්සිළුමිණි කුසදාවත් බෙහෙවින්ම මේ ගී කාව්‍ය ලක්ෂණවලට ම අනුකූල වෙනත් ''මධුපානොත්සව'' වර්ණනා ''කුස වලප'' වැනි සමහර තැන් අනුව, ඔහු ප්‍රතිභාපූර්ණ මහා කවියකු බව කිය හැකිය කව්සිළුමිණ කවියා රජකු බව පිළිගන්නා හෙයින්, රජකු විසින් සිය ජීවිතයේ දී අත් දුටු සමහර කරුණු අනායාසයෙන් මෙන් සිය කෘතියට ඇතුලත් වූ බැව් සිතිය හැකිය. එසේම කව්සිළුමිණෙහි ආරම්භය මහා කාව්‍ය සම්ප්‍රදායෙහි දක්වෙන නීතීන්ට පටහැනිව ගොස් ඇති නිසා මේ කවියා සම්ප්‍රදාය බිඳ තරමක් දුරට ඉදිරියට ගොස් ස්වකීය ස්වාධීනත්වය රැකගත් ඇයුරු පැහැදිලි වෙයි.

(ලකුණු 13)

03. දී ඇති මාතෘකාවලින් එකකට අදාළව වචන 300 - 350 අතර වන සේ විශ්ලේෂණාත්මක රචනාවක් ව්‍යාකරණානුකූලව ලියන්න.

I. දේශපාලන මතවාද හමුවේ අධිකරණයේ ස්වාධීනත්වය
ii. වත්මන් තරුණ පරපුර හා මත්ද්‍රව්‍ය උවදුර
iii. මෙරට කෘෂිකර්මාන්තය නගා සිටුවීම සඳහා කාලීන වැඩපිළිවෙළක අවශ්‍යතාවය.
iv. තරගකාරී ජීවන රටාව හේතුවෙන් අභියෝගයට ලක් වන මානව සබඳතා
v. ඓතිහාසික පුවත් හා සිංහල සිනමාවේ නව ප්‍රවණතා (ලකුණු 25 )

04. අ. පහත සඳහන් වාක්‍යවල සදොස් තැන් ඇතොත් නිදොස් කොට ලියන්න.

i. දරුවෝ පාඩම් නොකරත් නම් මව්පියෝ ඒ ගැන සැලකිලිමත් විය යුතුය.
ii. ඒ ආයතනයෙහි පාලකයන් කවුරු ද?
iii. මුවෝ හෝ හාවෝ හෝ පුඩුවට හසු වෙති.
iv. නිළියක් වූ ඇය ආදරණීය බිරිඳක් ද වූවාය.
v. සාමාජිකයෝ සියලු දෙනා අද දින රැස්වීමට පැමිණ නැත.

ආ. පහත සඳහන් වාක්‍ය කර්මකාරකයට හරවන්න.

i. රියදුරා දුව ද මව ද අනතුරින් බේරා ගත්තේ ය.
ii. විද්‍යාචක්‍රවර්ති බුත්සරණ රචනා කළේ ය.
iii. අගමැතිවරයා විදෙස් ඇමතිවරුන් සාදරයෙන් පිළිගනියි.
iv. නූතන කවියෝ නව අනුභූතීන් ඔස්සේ රචනා කරති.
v. දෙවන පැරකුම්බා මහ රජහු කුස ජාතකය ඇසුරු කොට කව්සිළුමිණ රචනා කළාහු ය.

ඇ. නිවැරදි වැකියක් නිර්මාණය කිරීම සඳහා සුදුසු පද වරහන් තුළින් තෝරා ලියන්න.

I. ඇතැම් (මව්පියෝ/මව්පියන්) දරුවන් පිළිබඳ වැඩි අවධානයක් (දක්වති/ දක්වයි)
ii. (ක්‍රීඩකයකු/ක්‍රීඩකයෙක්) ලෙස සේවය කරන ඔහු දක්ෂ (කළමනාකරුවෙකු/ කළමනාකරුවෙක්) ද වෙයි.
iii. බොහෝ (සිංහලයෝ/ සිංහලයන්) (බෞද්ධයෝ/ බෞද්ධයන්) වෙති.
iv. සභාපතිතුමා (කාරක සභිකයෝ/ කාරක සභිකයන්) රැස්වීමට (කැඳෙව්වේය/කැඳව්වෝ ය.)
v. පැරණි (දරුවෝ/ දරුවන්) මහා වැව් (බැන්දාහ/ බැන්දේය. )

(ලකුණු 5 x 3 = 15)

05. පහත දක්වෙන වාක්‍යවල **තද කළු අකුරින්** මුද්‍රිත පදවල ව්‍යාකරණ අංගය දක්වා ඇත. ඒවායෙහි අනුඅංගය දක්වන්න.

I. <u>නැණැති</u> <u>පුතාණ</u> දිවි <u>තෙක්</u> මව්පියන් රකිති.
(නැණැති - සන්ධි , පුතාණ - තද්ධිත , තෙක් - නිපාත)

ii. සසර <u>සරන</u> තුරු <u>නීරෝගී</u> <u>වේවා</u>
(සරන - කෘදන්ත, නීරෝගී - උපසර්ග , වේවා - ක්‍රියා)

iii. රටවැසියෝ දේශානුරාගයෙන් ගතද සිත ද පිනවා ගනිති.
(රට වැසියෝ - සමාස , දේශප්‍රරාගයෙන් - සන්ධි , ද , නිපාත)

iv. ඇත් අස්රථ පාබළ පිරිස් ගෙන ශක්‍රපුරයෙන් බව දිව්‍යභටයක් සදෙනකු සේ
(ඇත්අස් රථපාබල - සමාස , ශක්‍ර පුරයෙන් - විභක්ති , සේ - නිපාත)

v. මම මැරුණොත් දරු පැටව් ටික බලා ගන්න.
(මැරුණොත් - ක්‍රියා , දරු පැටව් - සමාස , බලාගන්න - ක්‍රියා)

(ලකුණු 3 x 5 = 15)

06. පහත දැක්වෙන වාක්‍යවල හිස්තැනට වඩාත්ම ගැළපෙන පදය වරහන තුළ දී ඇති පද අතුරෙන් තෝරා ලියන්න.
(ඓශ්වර්ය, දේශීය , ආරක්ෂා කිරීම , හෙළ , ගවේෂණය , සුරැකීම)

අ. I. සීගිරි බලකොටුවෙහි ජල නල පද්ධතිය .................................... තාක්ෂණයෙහි විස්මය ලොවට හඬ ගා කියන්නකි.

ii. .................................... සිරිත් අගයන සංස්කෘතිය උත්සවයක් නම් සිංහල අලුත් අවුරුදු උත්සවයයි.

iii. ශ්‍රී ලංකාවේ පුරාණ අග නගර .................................... සම්පන්න විය.

iv. ජාතික උරුමයන් .................................... වත්මන් පරපුරෙහි වගකීමකි.

v. ලෝකවාසීන් අප රට දෙස නෙත් යොමා බලා සිටින්නේ අප මානව හිමිකම් .................................... පිළිබඳය.

vi. මුහුදේ පුරාවිද්‍යාත්මක වස්තු .................................... කිරීමට හා ඒවායේ කාලය තහවුරු කිරීමට නවීන තාක්ෂණික ක්‍රමෝපායන් භාවිතා කරයි.

(ලකුණු 1/2 x 6 = 3)

ආ. පහත දක්වා ඇති පද සන්ධි කර ලියන්න.

i. විනය + ආරක්ෂාව
ii. පංච + ඉන්ද්‍රිය
iii. මධු + උත්සවය
iv. නරන් + ඉඳු
v. කවි + ඉන්ද්‍ර
vi. කුල + අඟන

(ලකුණු 1/2 x 6 = 3)

ඇ. තද කළු අකුරින් මුද්‍රිත පදවල විභක්ති නම් කරන්න.

i. **උවසු - උවැසියනි** , ඉවසීම පුගුණ කරන්නැයි හිමි නම කීවේ ය.

ii. **මිත්‍රළ** විත් **ගං වෙරළට** රැස් වූ

iii. උඳුවප් **මාසයේ ශීතලෙන්** පරිසරය කුල්මත් විය.

(ලකුණු 1/2 x 6 = 3)

ඈ. අවශ්‍ය තැන්වල විරාම ලක්ෂණ යොදා පහත දැක්වෙන වාක්‍ය නැවත ලියන්න.

I. ද්විතීය පරාක්‍රමබාහු මහරජුගේ අමාත්‍යවර බුද්ධත්වාභිලාෂී බුදු බව කැමති වූ දේවප්‍රතිරාජයන් විසින් බෝධිසත්ත්ව පාරමිතාවෙන් යෙදුණා වූ බණක් වදාරන මෙන් කරන ලද ආරාධනයයි.

ii. මහාපරාක්‍රමබාහු රජ සමය (ක්‍රි ව 1153 86) දක්වා කාලය සශ්‍රීක කාල පරිච්ඡේදයක් බව එතුමාගේ ක්‍රියා කලාපය එයට දෙස් දෙයි

iii. විශේෂ අමුත්තා නැගිට නළුවන් කරා පා නැගුවේය සතුට පළ කළේය සමු ගත්තේ ය

(ලකුණු 1/2 x 6 = 3)

ඉ. පහත දැක්වෙන ප්‍රකාශනවල එක් එක් ප්‍රකෘති කථනය විකෘති කථනයට හරවා ලියන්න.

i. ''මං අද රැකියාවක් සඳහා අයදුම් පත්‍රයක් තැපැල් කරනවා'' යි අක්කා පැවසුවා ය.

ii. ''බෝ නොවන රෝග මර්දනය කිරීමට ඔබගේ අවශ්‍යතාවය හා කැප කිරීම අවශ්‍ය යැ'' යි ප්‍රධාන වෛද්‍යතුමා රැස් වූ පිරිසට දැනුම් දුන්නේ ය.

iii. ''අපි මේ දරුවන් යහමඟට ගැනීමට දැඩි වෙහෙසක් ගන්නවා'' යි ගුරුවරු දෙමාපියන්ට පැවසුහ.

(ලකුණු 1 x 3 = 3)

07. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

<u>ථූපවංසය , දඹදෙණි අස්න , උම්මග්ගජාතක , සිංහල ජාතක පොත , දළදා සිරිත , සිංහල බෝධිවංසය , අනාගත වංසය හා දළදා පූජාවලිය</u> යන ග්‍රන්ථ කුරුණෑගල යුගයේ දී ලියැවුණ පොත් ය. පොළොන්නරු යුගය , දඹදෙණි යුගය වැනි දේශපාලන සමයයන්හි දී ලියන ලද පොත් සංඛ්‍යාවට වඩා මේ කාලයේ දී කරන ලද ග්‍රන්ථ ප්‍රමාණය අඩුය. ඒ අතරම විශේෂත්වයෙන් දැකිය හැකි ලක්ෂණ නම් සියලු ග්‍රන්ථ සමූහයම වාගේ පරිවර්තන කෘති වන අතර නර්මාණ සාහිත්‍යයක් නොවීම ය.

වංස කථා පොත් පෙළේ තවත් පොතක ලෙස සිංහල ථූපවංශය හැඳින්විය හැක. පොළොන්නරු යුගයේ දී වාචිස්සර නම් හිමි කෙනෙකුන් විසින් ලියන ලද පාලි පොතක සිංහල පරිවර්තනය සිංහල ථූපවංසය විය. පොතේ අවසානයේ එන ''සකල විද්‍යාචක්‍රවර්ති පරාක්‍රම පණ්ඩිතයන් විසින් කරන ලද ථූපවංස කථාව කියා නිමවන ලදී'' යන වැකිය නිසා ථූපවංස ලියා ඇත්තේ විද්‍යාචක්‍රවර්ති නම් උපාධියක් ලැබ සිටි පණ්ඩිත පරාක්‍රම නම් තැනැත්තෙකු විසිනි. බුත්සරණෙ එහෙත් බුත්සරණ ලියූ විද්‍යාචක්‍රවර්ති ථූපවංසය ලියූ රචකයා නොවේ. භාෂාවේ දක්නට ලැබෙන ප්‍රධානතම වෙනස එක් හේතුවක් වන අතර, කාල වශයෙන් මේ පුද්ගලයන් දෙදෙනා අතර දක්නට ලැබෙන වෙනස දෙවන හේතුව වෙයි එසේ වුවත් බුත්සරණ තදින්ම ඇසුරු කරමින් ථූපවංශය කරන ලද බව කිව හැක. එහි එන නාලාගිරි වැනුම, ථූපවංසයේ එන දුටුගැමුණු එළාර සටනේ දී ක්‍රියා කල කඩොලැත් වර්ණන කිරීම සඳහා ප්‍රයෝජනයට ගෙන ඇත.

i. ඡේදයේ තද කළු අකුරින් මුද්‍රිත වචන අකාරාදි පිළිවෙළට සකස් කර ලියන්න.

ii. පොළොන්නරු , පරිවර්තන , විද්‍යාචක්‍රවර්ති යන වචනවල යෙදී ඇති පිලි වෙන වෙනම ලියන්න.

iii. ඉහත ඡේදයෙන් උපුටා දක්වන්න.

1. මහාප්‍රාණ අක්ෂරයක් හා අන්තඃස්ථ අක්ෂරයක් එක ළඟ යෙදී ඇති වචනයක්
2. දන්තජ අක්ෂරයක් හා සඤ්ඤක අක්ෂරයක් එක ළඟ යෙදී ඇති වචනයකි.
3. දන්තජ අක්ෂරයක් හා මහාප්‍රාණ අක්ෂරයක් එක ළඟ යෙදී ඇති වචනයක්

iv. පහත සඳහන් පද විසන්ධි කර සන්ධි විධිය දක්වන්න.
බුත්සරණ , කඩොලැත් , කෙනෙකුන්

v. පහත දැක්වෙන ක්‍රියා වර්ගවලට උදාහරණ වචනය බැගින් ඡේදයෙන් උපුටා ලියන්න පූර්ව ක්‍රියා , මිශ්‍ර ක්‍රියා , අතීත කෘදන්ත

(ලකුණු 3 x 5 = 15)

08. පහත සඳහන් මාතෘකාවලින් තුනක් තෝරා ගෙන කෙටි සටහන් ලියන්න.

i. මිශ්‍ර ක්‍රියා

ii. ස්වරාදේශ සන්ධිය

iii. විශේෂණ සමාස

iv. භාවාර්ථ නිපාත

v. අස්ත්‍යාර්ථය තද්ධිත ප්‍රත්‍යය

(ලකුණු 3 x 5 = 15)